විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2011 දිනය / திகதி / Date 2011-07-04

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/ 2011**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛණය අර්ථ කතනය කිරීම

මවිසින් 2010- 05- 25 දිනැති නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 5/2010 චක්‍රලේඛය අවලංගු කරමින් මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ලැබේ. ඒ අනුව 2011- 05- 13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව පහත සඳහන් තනතුරු "ට" උපලේඛණයට අයත් වේ.

1. අතිගරු ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලය
   පෞද්ගලික ලේකම්/ ප්‍රවෘත්ති ලේකම්/ සහකාර ලේකම්, (ප්‍රවෘත්ති)/ අතිරේක පෞද්ගලික ලේකම්/ මාධ්‍ය ලේකම්/ ජනාධිපති ලේකම්ගේ පෞද්ගලික සහකාර, මහජන සම්බන්ධතා නිලධාරී

2. ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය
   පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

3. ගරු කථානායකතුමාගේ කාර්ය මණ්ඩලය
   පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

4. ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය
   පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

5. ගරු විපක්ෂනායකතුමාගේ කාර්ය මණ්ඩලය
   පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

6. ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය
පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

7. ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ කාර්ය මණ්ඩලය
පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

8. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමාගේ කාර්ය මණ්ඩලය
පෞද්ගලික ලේකම්/ සම්බන්ධීකරණ ලේකම්/ මහජන සම්බන්ධතා නිලධාරී/ මාධ්‍ය ලේකම්

9. ගරු ව්‍යාපෘති අමාත්‍යවරු/ දිස්ත්‍රික් අමාත්‍යවරු/ රාජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය
පෞද්ගලික ලේකම් (හිටපු කාර්ය මණ්ඩලයට පමණි)

10. කැබිනට් අමාත්‍යාංශයක ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පළාත් සභාවක ප්‍රධාන ලේකම්ගේ
සම්බන්ධීකරණ ලේකම්/ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්
කැබිනට් අමාත්‍යාංශයන්හි ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති)
(දැනට මෙම තනතුර අහෝසි වී ඇත. යෙදී සිටි අයට පමණයි)

2011 මැයි මස 13 වැනි සිකුරාදා නිකුත් කරන ලද අංක 1706 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී තනතුර සහ ඉහත සඳහන් සියළු මාධ්‍ය ලේකම් තනතුරු 2010- 04- 24 වැනි දින සිට ලේඛණගත කරන අතර ඔවුන්ට ද මෙහි සඳහන් සියළු විධිවිධාන අදාල වේ.

ඉහත සඳහන් තනතුරු විශ්‍රාම වැටුප් සහිත වුවත් නොවුවත්, තනතුර ස්ථිර බව නොසලකා වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 සහ "අ අ" වගන්තිය යටතේ විශ්‍රාම වැටුපකට පමණක් හිමිකම ඇත. මෙම නිලධාරීන්ට වසර 05 ක සේවා කාලයක් සඳහා අවසන් වරට ලැබූ වැටුපෙන් 1/3 ක විශ්‍රාම වැටුපක් හිමිවන අතර, වසර 15 ක සේවා කාලයක් සපුරා ඇත්නම් අවසන් වරට ලැබූ වැටුපෙන් 2/3 ක විශ්‍රාම වැටුපක් හිමිවේ. (පාරිතෝෂිකයක් රහිතව). මෙම "ට" උපලේඛණයේ සඳහන් තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

1. ගරු අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා නව පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ගේ වැටුපෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් අයකළ යුතුය. විශ්‍රාම වැටුප් හිමිකම සඳහා අවම සේවා කාලය (එනම් කවර හෝ සේවා කඩවීම් පවතින්නේ නම් ඒවා නොතකා) වසර 5 ක් තිබිය යුතුය.

2. රජයේ සේවයේ නියුක්ත ස්ථිර විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන් ගරු අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලයේ තනතුරු වල නියුක්ත වීම සඳහා රාජ්‍ය සේවයෙන් මුදාහැර ඇත්නම් එවැනි නිලධාරියෙකුගෙන් "ට" උපලේඛණගත තනතුරට අදාල සේවා කාලය තුළ අයකළ යුතු වන්නේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල්ය. මෙවැනි නිලධාරීන් වසර 5 ක් සම්පූර්ණ කොට ඇති විට "ට" උපලේඛණය යටතේ විශ්‍රාම ගැන්වීම හෝ යලි පෙර රාජ්‍ය සේවා තනතුරට යා හැකි අතර, වසර 5 ට අඩු සේවා කාලයක් පවතී නම් නැවත රාජ්‍ය සේවයට යා යුතුය.

3. “ට” උපලේඛනය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සහිත පෙර සේවා කාලය පමණක් විශ්‍රාම වැටුප් ගණනය සඳහා අදාල කරගත හැකිය.

4. රජයේ විශ්‍රාමික නිලධාරීන් ගරු අමාත්‍ය මණ්ඩල කාර්ය මණ්ඩලයේ තනතුරු දරණ විට ඔවුන්ගෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් හෝ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් දායක මුදල් අයනොකළ යුතුය. (රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සම්බන්ධව අදාල උපදෙස් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 4/ 2010 ඇතුලත් වේ.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 යටතේ සහන මෙම නිලධාරීන්ට හිමිනොවන අතර, විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමට නම් යලිත් වසර 05 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය. “ට” උපලේඛණගත නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප සකස් කිරීමේදී ඔහු අවසන් වශයෙන් අදාල තනතුරෙහි සේවය කළ අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත සඳහන් ඇමුණුම් සහිතව විශ්‍රාම වැටුප් ලිපිගොනුව සකස් කොට මෙම දෙපාර්තමේන්තුවට එවීමට ක්‍රියාකළ යුතුය.

I. පොදු 55 අයදුම්පත්‍රය.
II. “ට” උපලේඛණගත තනතුර අදාල පත්වීම් ලිපිය.
III. චර්යා සටහන්.
(මෙම ලේඛණ බලයලත් නිලධාරියෙකු සහතික කර තිබිය යුතුය.)
IV. වසරක් පාසා නැවත සේවයේ යෙදවූ පත්වීම් ලිපිය.
V. සේවය අවසන් කිරීමේ ලිපිය.
VI. $3\frac{1}{2}$, $2\frac{1}{4}$ ප්‍රමාණයේ කළු සුදු ජායාරූප 3 ක්.
VII. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ ලබාගත් විස්තර.
VIII. දැනට විශ්‍රාම වැටුප් ලබාගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා විශ්‍රාම වැටුප් අංකය.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
04. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති.